# ධීවර ත්‍යාග අරමුදල - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ධීවර ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ ලැබීම් රු. 477,415 ක් වූ අතර, ඉකුත් වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ රු. 525,010 ක ශේෂය සමඟ ඉදිරියට ගෙන යනු ලබන මුළු ශේෂය රු. 1,002,425 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ විධිවිධාන යටතේ ධීවරයින් විසින් මුහුදේදී කරනු ලබන වැරදි සම්බන්ධයෙන් අධිකරණයක නඩු පැවරීමටත් රාජසන්තක කරන ලද මසුන් හා තහනම් නොවන භාණ්ඩ වෙන්දේසි කර ලැබෙන මුදල් ත්‍යාග අරමුදලට බැර කිරීමටත් එම මුදලින් වැටලිම්වලට සහභාගී වූ තැනැත්තන්ට ත්‍යාග මුදලක් ගෙවීමටත අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

එසේ වුවද, ඉකුත් වර්ෂයේ ඉදිරියට ගෙන එන ලද රු.525,010 ක් හා සමාලෝචිත වර්ෂය තුල අරමුදලට රැස්කරන ලද රු.477,115 ක් වශයෙන් එකතුව රු.1,002,425 ක ආදායමක් අරමුදලේ පැවතයද වැටලීම්වලට සහභාගී වූවන්ට ත්‍යාග වශයෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුලද ගෙවා නොතිබුණු අතර, 2010 වර්ෂයට පසු රාජසන්තක කරන ලද තහනම් නොවන භාණ්ඩ වෙන්දේසි කර ආදායම ත්‍යාග අරමුදලට බැර කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) ධීවර හා ජලජ සම්පත් පනත හා බලාත්මක වන නියෝග උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් විවිධ චෝදනා යටතේ සමාලෝචිත වර්ෂයේ පවරන ලද නඩු සංඛ්‍යාව 165 ක්වූ අතර ඉකුත් වර්ෂයේ නඩු සංඛ්‍යාව 187 ක් විය.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

සමාලෝචිත වර්ෂය තුල මසුන් අලෙවියෙන් රැස්කර අධිකරණයේ තැන්පත් කරන ලද රු.117,580 ක ආදායම අධිකරණයෙන් ලබා ගෙන ත්‍යාග අරමදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.